ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## මාධ්‍ය නිවේදනය

**<u>ඉන්දියාවේ 80 වන නිදහස් දිනය සැමරේ</u>**

ඉන්දියාවේ 80 වන නිදහස් දිනය 2026 අගෝස්ත15 වන දින මහත් උනන්දුවකින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සමරන ලදී. කොළඹ පැවති ප්‍රධාන උත්සවය ඉන්දියානු මහ කොමසාරිස්තුමාගේ නිල නිවස වන 'ඉන්ඩියා හවුස්' හිදී පැවැත්විණ. ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා ඉන්දීය ජාතික ධජය එසවීමෙන් අනතුරුව හමුදා උත්තමාචාර නිරීක්ෂණය කළේය. එසේම, එතුමා ඉන්දීය ජනාධිපතිතුමියගේ නිදහස් දින පණිවිඩයෙන් උපුටා ගත් කොටස් ද ඉදිරිපත් කළේය.

2. මෙම වසරේ දී ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විවිධ කාල කලාපයන් පුරා සූර්යයාගේ ගමන අනුගමනය කරමින් ඉන්දියානු තානාපති කාර්යාල විසින් ඉන්දීය ධජය ඔසවා මව්බිමට උපහාරය පුද කල සුවිශේෂී ගෝලීය වැඩසටහනක් වන 'සූර්යපත් තිරංගා' වැඩසටහනට සහභාගී විය. කත්මණ්ඩු නුවර ඉන්දියානු තානාපති කාර්යාලයෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ දී ඉන්දීය ධජය ඔසවන ලද අතර එක් සූර්ය උදාවක සිට ඊළඟ සූර්ය උදාව දක්වා දිවෙන සංකේතාත්මක වැඩසටහන අඛණ්ඩ ඉදිරියට ගෙන යමින් ඉන් අනතුරුව මාලේ හි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ඉන්දීය ජාතික ධජය ඔසවන ලදී.

3. සංස්කෘතික වැඩසටහන් රැසක් සැමරුම් විචිත්‍රවත් කල අතර ශ්‍රී ලංකා නාවික හමුදා තූර්ය වාදක කණ්ඩායම වීරත්වය සහ දේශාභිමානය කැටිකර ගත් ගීත ඉදිරිපත් කළේය. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් විසින් ප්‍රසිද්ධ ජාතිකාභිමානී ගීතයන්ට නර්තනයන් ඉදිරිපත් කරන ලදී.

4. මහ කොමාසාරිස්තුමා සහ මහ කොමාසාරිස් කාර්යාලයේ නිලධාරිහු ශ්‍රී ලංකාවේ සාමය සහ එකමුතුභාවය ආරක්ෂා කරමින් දිවි පිදූ ඉන්දීය සාම සාධක බලකායේ සෙබළුන් සිහි කරමින් ඉන්දීය සාම සාධක බලකා ස්මාරකය අභියස උපහාර ද දැක්වූහ.

5. මෙම වසරේ නිදහස් දින සැමරුම හා සමගාමීව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් මධුභානි සිතුවම් වැඩමුළුවක්, වර්ලි (ගෝත්‍රික) කලා වැඩමුළුවක්, දරුවන් සඳහා ඉන්දියා-ශ්‍රී ලංකා මෛත්‍රී

චිත්‍ර තරඟය සහ 'මගේ කැමරා කාචයනේ ඉන්දියාව' (India Through My Lens) යන මැයනේ ශ්‍රී ලාංකේය සහභාගීවන්නන් විසින් ගත් ඉන්දියාවේ භූ දර්ශන, සංස්කෘතිය, ආහාර පාන සහ පුද්ගලයන්ගේ සුවිශේෂී ඡායාරූප ඇතුළත් ඡායාරූප තරඟයක් පවත්වන ලදී. 80 වන නිදහස් දිනය සැමරීම සඳහා භාරත් කෝ ජානියේ (ඉන්දියාව ගැන දැනගන්න) තරඟාවලියේ විශේෂ නිදහස් දින තරඟයක් ද ලොව පුරා පැවති අතර ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින ශක්තිමත් සම්බන්ධතාවය පිළිබිඹු කරමින් ශ්‍රී ලාංකේය තරුණකරුවන් රැසක් ඒ සඳහා සහභාගී වූහ. 2026 අගෝස්තු 15 වන දින ඉන්ඩියා හවුස් හි පැවති උත්සවයේදී මෙම තරඟයෙන් වැඩිම ලකුණු ලබාගත් ජයග්‍රාහකයන් ඇගයිණ.

6. ඉන්දියාවේ ජාතිය හා බැඳී වූ ගීතය වන වන්දේ මාතරම් ගීතයේ 150 වන සංවත්සරය සමරමින්, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම සාංවත්සරික වසරේදී වැඩසටහන් රැසක් සංවිධානය කර තිබිණ. කොළඹ පුරා ගායක ගායිකාවන් විසින් සමූහ වශයනේ වන්දේ මාතරම් ගීතය ගායනා කිරීම සහ ජනප්‍රිය ඉන්දිය ගායක ගායිකාවන් සහ සංගීතඥයන් විසින් එම ගීතය ඉදිරිපත් කිරීම මේ අතර විය. මෙම වසරේදී, සෑම ඉන්දියානුවකුටම ජාතික ධජය ඔසවා ඒ සමඟ ඡායාරූපයක් ගැනීමට ආරාධනා කරමින් පැවති හර් ඝර් තිරංගා ගෝලීය වැඩසටහන සඳහා ද ශ්‍රී ලංකාවේ මහත් උනන්දුවක් පැවතිණ. අගෝස්තු 15 වන දින පැවති නිදහස් දින සැමරුම අතරතුරදී ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හර් ඝර් තිරංගා නමින් ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර එහිදී ජාතික ධජයේ වැදගත්කම සහ ඉන්දියාවේ නිදහස් සටනේදී වන්දේ මාතරම් ගීතය විසින් ඉටු කළ භූමිකාව ප්‍රදර්ශනය කරන ලදී.

7. 80 වන නිදහස් දිනය නිමිත්තනේ මහනුවර සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ යාපනයේ සහ හම්බන්තොට පිහිටි ඉන්දියානු කොන්සියුලර් ජනෙරාල් කාර්යාල විසින් ද විවිධ විශේෂ සැමරුම් සහ සංස්කෘතික වැඩසටහන් සංවිධානය කර තිබිණ.

8. අගෝස්තු 15 වන දින සන්ධ්‍යාවේ ප්‍රවීණ වීණා වාදක රාජේෂ් වෛද්‍යා සහ ජනප්‍රිය ශ්‍රී ලාංකේය ගායන ශිල්පිණී යොහානි විසින් ඉදිරිපත් කරන ලද 'ස්වර් සංගම්' සංගීත ප්‍රසංගය පැවැත්විණ. එසේම, හැව්ලොක් සිටි මෝල් සාප්පු සංකීර්ණය ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා එක්ව සංවිධානය කරන ලද 'ඉන්දියා ෆෙස්ට් 2026' යන විචිත්‍රවත් උළලෙ 2026 අගෝස්තු 15-16 දදින පැවැත්වුණු අතර එය ඉන්දියාවේ පොහොසත් උරුමය පිළිබඳව අපූරු අත්දැකීමක් ලබා ගැනීමට මහ ජනතාවට අවස්ථාව

සළසා දමේන් ඉන්දියාවේ විලාසිතා, අත්කම් නිර්මාණ, ආහාර පාන, සජීවී ඉදිරිපත් කිරීම්, චිත්‍රපට ප්‍රදර්ශන සහ සංස්කෘතිකාංග රැසකින් සමන්විත විය.

***

**කොළඹ**
***2026* අගෝස්තු *17***